"ශ්‍රී ලංකාව මානසික සෞඛ්‍ය අර්බුදයකද?" යන සිරස්තලයෙන් යුතුව ඉරිදා ලංකාදීප (මාර්තු 30, 2022) පළවූ ලිපිය ඔස්සේ, ශ්‍රී ලංකාවේ පවත්නා මානසික සෞඛ්‍ය ගැටළු සහ ඒ ඔස්සේ සිදුවිය හැකි දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබිණි.

දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් සහ ඒ ආශ්‍රිතව ලියැවෙන පුවත් හා ලිපි සමගින් හදිසි උපකාරක අංක සඳහන් කරන ලෙසින් මාර්ගෝපදේශයන් මගින් මාධ්‍ය දිරිමත් කෙරෙන්නේ, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුතු අයෙකු උපදේශන සේවාවකට යොමු කිරීමටත්, ඒ ඔස්සේ තවත් ජීවිතයක් බේරාගැනීමටත් අවකාශ ලැබිය හැකි හෙයිනි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍ය අර්බුදය පිළිබඳව ලියැවුණු මෙවැනි කාලීන ලිපියක් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීමට ඉරිදා ලංකාදීප පුවත්පත කටයුතු කර තිබීම සැබවින්ම ප්‍රශංසනීය බව අපි මෙසේම පවසමු.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926